

# මුං කැවුම

අම්මා මුං කැවුමක් සාදා තාච්චියට බැදෙන්නට දැම්මා. එතකොට මුං කැවුම නැගිට මෙසේ කීවා.

"අර ළමයින්ට මා කන්න වුවමනා වී තිබෙන නිසා මා බේරී යන්න ඕනෑ." මෙසේ කියා මුං කැවුම තාච්චියෙන් ඉවතට පැන දුවන්නට වුණා.

ළමයි ඔවුන්ගේ කැවුම දුවන නිසා අඬන්න පටන්ගත්තා. එහෙත් මුං කැවුම නැවතුණේ නෑ. එය තවත් ඉක්මනට දිව්වා. මිනිසෙක් එය දැක "මුං කැවුමේ, නවතින්න! නවතින්න! මට නුඹ කන්න ඕනෑ" යයි කීවා. මුං කැවුම නවතින්නේ නැතිව දුවන්න වුණා. බළලෙක් මෙය දැක්කා. "මුං කැවුමේ නැවතියන්. මට නුඹ කන්න ඕනෑ" යැයි කීවා.

බල්ලෙක් මුං කැවුම දැකලා ඇහුවා, "නුඹ දුවන්නේ මොකද" කියා. "ඔවුන් මා කන්නට හදන නිසා ඉක්මනට දුවනවා" යයි මුං කැවුම උත්තර දුන්නා. "හොඳයි, මම නුඹ බේරාගන්නම්" යයි බල්ලා මුං කැවුමට කීවා. මුං කැවුම බල්ලා ළඟට කිට්ටු වුණා විතරයි, ඌ එය ගිල දැම්මා.

